ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 09 | විෂයය Subject: බුද්ධ ධර්මය | කාලය Time: පැය 02 |

නම : ..........................................................................................................................................................

★ අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ රෝගීව සිටිනු දුටු මට බලවත් ශෝකයක් හට ගැනිණි. මම සිහිය උපදවා ගත නොහැකි තත්ත්වයට පත්වීමි.... මෙසේ ප්‍රකාශයට පත් කරන ලද්දේ,

1. මුගලන් තෙරුන් ය
2. අනුරුද්ධ තෙරුන් ය
3. ආනන්ද තෙරුන් ය
4. සැරියුත් තොරුන් ය

02. බුදුරදුන්ගෙන් බණ අසා තෙරුවන් සරණ ගිය පසු ඔහු උන් වහන්සේට සිනිඳු සළු පිදීය. එම සිනිඳු සළු යුගල බුදු රදුන්ට පිදුවේ,

1. ආළාර කාලාම තවුසා ය
2. ආනන්ද තෙරුන් ය
3. පුක්කුස නම් මල්ල රාජ පුත්‍රයා
4. චුන්දකර්මාර පුත්‍රයා ය

03. සොළොස්මස්ථාන අතර මිහින්තලේ, සේල චෛත්‍යයේ තැන්පත් කර ඇති ධාතුන් වනුයේ,

1. සර්වඥධාතුන් නිදන් කර තිබීම
2. බුදු රදුන්ගේ ලලාට ධාතුව
3. බුදු රදුන්ගේ ඌර්ණරෝම ධාතුව නිදන් කිරීම
4. පාත්‍රා ධාතුන් වහන්සේ

04. ''ස්වාමීනී අපේ වංශය මහා සම්මත ක්ෂත්‍රිය වංශයයි. එහි කිසිවකු සිගමන් ගොස් නැත'' යනුවෙන් ප්‍රකාශයට පත් කළේ,

1. කොසොල් රජතුමා
2. බින්දුසාර රජතුමා
3. බිම්බිසාර රජතුමා
4. සුද්ධෝදන රජතුමා

05. මහා ප්‍රජාපතීගෝතමියගේ සහ මහාමායා දේවියගේ මව සහ පියා වූයේ,

1. දෙව්දහ නුවර යශෝධරා දේවිය හා අංජන රජතුමා
2. කිඹුල්වත් නුවර යශෝධරා දේවිය අංජන රජතුමා
3. විශාලා මහනුවර යශෝධරා දේවිය හා අංජන රජතුමා
4. දෙව්දහ නුවර බිම්බා දේවිය හා අංජන රජතුමා

06. ''රජතුමනි මැය අරහත්වන ජාතියේ ඔබ වැනි මයිලනු කෙනෙකුගේ ආරක්ෂාව ඇතිව සිටියදදී මට පක්ෂපාතීව කල් ගෙවීම පුදුමයක් නොවේ'' යනුවෙන් බුදුරදුන් ප්‍රකාශ කළේ,

1. මහාමායා දේවිය අරඹයා ය
2. මහා ප්‍රජාපතීගෝතමී දේවිය අරඹයා ය
3. ජනපද කල්‍යාණිය අරඹයා ය
4. භද්දකච්චායනා අරඹයා ය

08. ''චතු අප්පමඤ්ඤා'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

1. දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය
2. මෙත්ත, කරුණා , මුදිතා, උපේක්ඛා
3. අත්ථි සුඛ, භෝග සුඛ , අණන සුඛ , අනවජ්ජ සුඛ
4. ලාභ අලාභ , යස අයස , නින්දා ප්‍රශංසා , දුක සැප

09. සිඟාලෝවාද සූත්‍රයෙහි සේව්‍යය සේවක සබඳතා සඳහන් කිරීමේදී එයට අයත් නොවන්නේ,

1. සේවකයාගේ ශක්ති ප්‍රමාණයට වැඩ කොටස් පැවරීම
2. නිසි පරිදි ආහාර හා වැටුප් ලබා දීම
3. සෞඛ්‍ය පහසුකම් ලබා දීම
4. යහපත් ක්‍රියාවල යෙදවීම

10. සිඟාලෝවාද සූත්‍රයෙහි උඩ දිසාවට අයත් වනුයේ,

1. සේව්‍ය සේවක සබඳතාවය යි
2. ගිහි පැවිදි සබඳතාවය යි
3. අඹු සැමි සබඳතාවය යි
4. ගුරු සිසු සබඳතාවය යි

11. ඕලු ගඟ උදකුක්ඛේප සීමා මාලකයේ දී අධි සීල සංඛ්‍යාත උපසම්පදාව ලැබුවේ,

1. බලංගොඩ මහානායක හිමි ය
2. වාරියපොළ ශ්‍රී සුමංගල හිමි ය
3. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය

12. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සතර සතිපට්ඨානය අයත් වන්නේ,

1. සම්මා වායාම ය
2. සම්මා ආජීවට ය
3. සම්මා සතියට ය
4. සම්මා වාචාවට ය

13. සමාධි ශික්ෂාවට අයත් වන්නේ,

1. සම්මා දිට්ඨි, සම්මා සංකල්ප
2. සම්මා වායාම, සම්මා සති
3. සම්මා සමාධි, සම්මා ආජීව
4. සම්මා සමාධි, සම්මා කම්මන්ත

14. සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිව්පස පිළිගැන්වීමට සුදුසු වන නිසා භික්ෂූන් වහන්සේ,

1. සාමීචිපටිපන්න ය  2. පාහුණෙය්‍යය  3. ආහුණෙය්‍යය  4. දක්ඛිණෙය්‍යය

15. 1896 අගෝස්තු මස 23 වන දින බිහි වූ පින්වත් කුලදරුවාගේ නම වූයේ,

1. ධර්මපාලතුමා  2. කුලතුංග බණ්ඩාර  3. තෂිනම්ගල්  4. විලියම්

16. සීතාවක රාජසිංහ වැනි මහා රණශූරයෙකුට ඔරු කබලක් මත අසරණව අවසන් හුස්ම හෙලන්නට සිදුවේ. මෙම වැකිය තුලින් අටලෝ දහමේ ......................... සඳහන් වේ.

1. නින්දා , ප්‍රශංසා  2. සැප , දුක  3. යස , අයස  4. ලාභ , අලාභ

17. බුදු රදුන් ජීවමාන කාලයේ ම පිරිනිවන් පාන්නට තීරණය කළ තෙරණිය,

1. ඛේමා තෙරණි ය
2. යශෝදරා තෙරණි ය
3. ප්‍රජාපතී ගෝතමී ය
4. නන්දා තෙරණි ය

18. ලද දෙයින් සතුටුවීම හඳුන්වනු ලබන්නේ,

1. අප්පකිච්චෝ
2. සල්ලහුකවුත්ත
3. සන්තුස්සකෝ
4. සුභ

19. කර්මය හා විපාක යන දෙකම ප්‍රතික්ෂේප කළ ශාස්තෘවරයා වූයේ,

1. මක්කලී ගෝසාල
2. සංජය බෙල්ලට්ටපුත්ත
3. පකුධ කච්චායනය
4. පූර්ණ කස්සප

20. භික්ෂුණී ශාසනය පිහිටුවීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කරනු ලැබුයේ,

1. ආනන්ද තෙරුන් වහන්සේ
2. සැරියුත් තෙරුන් වහන්සේ
3. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ
4. මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් වහන්සේ

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. (i) ඔබ පාසලේ දෙවන වාරයට නියමිත ඇගයීම් කාරකය නම් කරන්න.
(ii) එම ඇගයීම් සඳහා යොදා ගත් නම කුමක්ද?
(iii) ''සීලය'' කෙටියෙන් හදුන්වන්න
(iv) සිල්වත්කම ගොඩ නැංවීම පිණිස ඇනුදැන වදාළ ශික්ෂා පද රාශියකි. ඉන් 2ක් නම් කරන්න
(v) හිරි ඔත්තප්ප යනු හඳුන්වන්න.
(vi) සීලයෙහි ත්‍රිකෝටි පාරිශුද්ධය නම් කරන්න.
(vii) අත්තූපනායක ධර්මය හඳුන්වන්න.
(viii) සීලය ආරක්ෂා කිරීමෙන් ඔබ ජීවිතයට ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
(ix) එම ප්‍රයෝජන දෙක සමාජය යහපත් වන අයුරු පහදන්න.
(x) ශිෂ්‍යයකු වශයෙන් ඔබගේ ශිෂ්‍ය ජීවිතයට සීලය තුලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (i) බුදුරජාණන් වහන්සේ විශාලාවෙන් පිටත්ව භාණ්ඩාගම, හත්ථිගාම, අම්බගාම ආදී ගම් පසුකරමින් අවසානයට වැඩම කල නගරයේ නම ලියන්න. (ල. 2)
(ii) ''සතර මහෝපදේශ'' යන් ගෙන් 03ක් සඳහන් කරන්න. (ල. 3)
(iii) සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදුවීම් තුලින් ගත හැකි ආදර්ශ 5ක් අදාළ සිද්ධිය සමඟ සසදන්න. (ල. 5)

03. (i) යථාවාදී තථාකාරී බව හා යථාවාදී තථාවාදී බව ලියා දක්වන්න. (ල. 2)
(ii) තාදී ගුණය හදුන්වා එම ගුණයට අදාල අටලෝ දහමින් ගුණ දෙකක් නම් කරන්න. (ල. 3)
(iii) බුදු සිරිතෙහි විශිෂ්ට ලක්ෂණ 5ක් ලියා දක්වන්න. (ල. 5)

04. (i) සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා ........ කවිය අයත් ග්‍රන්ථය නම් කරන්න. (ල. 2)
(ii) එම කවිය සම්පූර්ණ කරන්න. (ල. 3)
(iii) සඟ ගුණ ලියා දක්වන්න. (ල. 5)

05. (i) මහා ප්‍රජාපතී ගෝතමියගේ සහ භද්ධකච්චායනා තෙරණියන් පිරිනිවන් පාන ලද කාල සීමාවන් නම් කරන්න. (ල. 2)
(ii) මහා ප්‍රජාපතී ගෝතමිය තෙරණියගේ චරිතයෙහි ආදර්ශ 3ක් ලියන්න. (ල. 3)
(iii) භද්කච්චායනා තෙරණියගේ චරිතයෙහි ආදර්ශ 5ක් ලියා දක්වන්න. (ල. 5)

06. (i) ධම්මපද ග්‍රන්ථයේ ගාථා ගණන සහ වග්ග ගණන නම් කරන්න. (ල. 2)
(ii) සූකරානී අසාධූනී ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 3)
(iii) එම ගාථාවෙහි තේරුම ලියන්න. (ල. 5)

07. (i) ත්‍රි ශික්ෂායෙහි පඤ්ඤා ශික්ෂාවට අයත් අංග 2 ලියා දක්වන්න. (ල. 2)

(ii) සම්මා සංකප්පයේ තුන් ආකාරය ලියා දක්වන්න. (ල. 3)

(iii) සම්මා ආජීවය සැකෙවින් ලියා දක්වන්න. (ල. 5)

08. පහත මාතෘකා අතරින් දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(i) සම්මා කම්මන්ත ය.

(ii) බලංගොඩ මහනායක හිමි

(iii) මෙත්තා ගුණය

(iv) ස්ථානෝචිත ප්‍රඥාව (ල. 2 × 5)